# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# ඇබෑර්තු

විශ්වවිද්‍යාල පද්ධතියේ ඉහළම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) ලේකම් කාර්යාලයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර (පොත් තැබීම) - III ශ්‍රේණිය

**1. සුදුසුකම්:**

(i) පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

- සිංහල භාෂාව / දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

**සහ**

(ii) එක් වරකදී අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව, අයදුම්කරුවන් පහත සඳහන් තනතුරට අදාළ විශේෂිත සුදුසුකම් සපිරිය යුතුය:

අ) නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය / තාක්ෂණික විද්‍යාලය මගින් පිරිනමනු ලබන ගිණුම්කරණ තාක්ෂණවේදී ජාතික සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් ඊට සමාන වෙනත් සුදුසුකමක් තිබීම.

**හෝ**

ආ) අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම වාණිජ විෂය ධාරාවෙන් ලබා තිබීම.

➢ පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ:

අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

**සහ**

ආ) පරිගණක යෙදවුම් භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද.

**2. වැටුප් පරිමාණය : U - MN 1 (III) – රු. 49,475 - 17 x 540 – රු. 58,655/–** මාසිකව

(රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ)

**3. බඳවා ගැනීමේ ක්‍රමය:**

(i) පහත සඳහන් විෂයයන් සඳහා පැවැත්වෙන ලිඛිත විභාගය මගින් (75% ලකුණු):

i. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම

ii. බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම

iii. පරිගණක සාක්ෂරතාව

iv. අදාළ විෂය ක්ෂේත්‍රය

**සහ**

(ii) සම්මුඛ පරීක්ෂණය (25% ලකුණු)

**4. යෝග්‍යතාව:**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**සාමාන්‍ය කොන්දේසි:**

(i) **අරමුදල් සහ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය:**

සේවකයා සහ පත්වීම් බලධාරියා (ආයතනය) විසින් පිළිවෙලින් වැටුපෙන් 10% ක් සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට (UPF) බැර කරනු ලැබේ. තවද, වැටුපෙන් 8% ක් ආයතනය මගින් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ඇත.

- පත්වීම් ලැබූ දින සිට අනිවාර්ය විශ්‍රාම යන වයස (ශාස්ත්‍රීය නොවන – අවුරුදු 60) දක්වා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් (20) හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන සේවකයින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දයක නොකරන අතර, එවැනි සේවකයින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයෙකු නොවනු ඇත.

(ii) **සේවක භාරකාර අරමුදල:**

ආයතනය මගින් වැටුපෙන් 3% ක් බැර කරනු ලැබේ.

(iii) **පාරිතෝෂික:**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධානවලට අනුකූලව පාරිතෝෂික ගෙවීම සිදු කරනු ලැබේ.

**වෙනත් කොන්දේසි:**

(i) අයදුම්පත් සැකසුම් ගාස්තුව:

ආපසු ගෙවනු නොලබන රු. 1,000/– ක අයදුම්පත් සැකසුම් ගාස්තුවක් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගිණුම් අංක 0002323287 වෙත ගෙවිය යුතුය. බැංකු රිසිට්පතේ පාරිභෝගික පිටපතෙහි ඔබගේ නම, බැංකු විස්තර සහ යොමු කිරීම ලෙස "Post of MA (Book Keeping) Gr III" යනුවෙන් සඳහන් කළ යුතුය. මුල් බැංකු රිසිට්පත අයදුම්පතේ දක්වා ඇති අදාළ කොටුවේ ඇලවිය යුතුය. අමුණා නොමැති මුල් බැංකු රිසිට්පත් හෝ අයදුම්කරුගේ විස්තර නොමැති බැංකු රිසිට්පත් භාරගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

(ii) ඉහත තනතුර සඳහා වූ අයදුම්පත්, UGC වෙබ් අඩවියේ (www.ugc.ac.lk) "Career Opportunities" සබැඳියෙන් බාගත කරගත හැකි නියමිත අයදුම්පත්‍ර ආකෘතිය භාවිතයෙන් ඉදිරිපත් කළ යුතුය.

(iii) නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත, අයදුම්කරුගේ ඡායාරූපය සහ අදාළ සියලුම සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2026.09.14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "**නියෝජ්‍ය ලේකම් / පිරිස් අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නො. 20, වෝඩ් පෙදෙස, කොළඹ 07**" යන ලිපිනයට යොමු කළ යුතුය. නියමිත ආකෘතියෙන් එවනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ.

(iv) ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "**Post of MA (Book Keeping) Gr III**" යනුවෙන් සඳහන් කළ යුතුය.

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් / ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන / අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතුවේ.

**ලේකම්,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**නො. 20, වෝඩ් පෙදෙස, කොළඹ – 07**
**2026.08.28**